**ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

------------------------------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහ ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

-------------------------

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 29 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි විධිවිධානයන්ට අනුගත වී නොතිබීම** | **එම නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| 128 (1) (අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කරගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | (i) | සැලසුම් පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| | | (ii) | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම. | |
| | | | ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් | 2.2.2 |
| | | (iii) | පරිදි සැලසුම් නොකිරීම. | |
| | | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2.3.1 |
| | | | ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | |
| | | (iv) | තාත්වික ලෙස අයවැය | 2.3.2 |
| | | | ඇස්තමේන්තු පිළියෙල | |
| | | (v) | නොකිරීම. | 2.6 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදි පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදි ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | (i) | ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.8 |
| | | (ii) | අනුකූල නොවීම්. | 2.9 |

| | | | |
|---|---|---|---|
| 128 (1) (ඉ) | රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් බඩු බාහිරාදි උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබාගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිශ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128 (1) (ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව, ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙයින් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම. | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එසේ වුවද බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් වූ ක්ෂේත්‍ර විමර්ශන පැවැත්වීම, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වන වගන්තිය යටතේ ගැසට් කිරීම, ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂණ පැවැත්වීම, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ ගැසට් කිරීම, රෙජිස්ට්‍රාර් වෙත යොමු කිරීම ආදිය වෙනුවෙන් 2017 වර්ෂයේ ඉලක්කයන් 2016 වර්ෂයේ ඉලක්කයන් හා සැසඳීමේදී සියයට 54 කින් පහත හෙලා තිබීම සැලසුම් කිරීමේ දුර්වලතාවක් වන බව නිරීක්ෂණය විය.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඒකාබද්ධ සැලැස්මක් (Integrated System) ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 08 ක ප්‍රතිපාදනයක් සැලසුම් කර තිබුණද, සැලසුම් කළ පරිදි එය ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ 2017 වර්ෂයේ මැන වෙන් කිරීම්, පරීක්ෂා කිරීමේ ඉලක්කය ගම් 21 ක් වුවද ගම් 14 ක් පමණක් පරීක්ෂාකර නොතිබුණි.

**(ආ) කාර්යය ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2021 වර්ෂය අවසන් වන විට බිම්සවිය වැඩ සටහන නිම කිරීමට මූලිකව සැලසුම් කර තිබුණි. එසේ වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 ට අයත් මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3659 න් කොට්ඨාශ 1374 ක පමණක් මිනුම් කටයුතු අවසන් කර තිබූ අතර එය මුළු සංඛ්‍යාවෙන් සියයට 38 ක් වී තිබුණි.

(ii) හිමිකම් ගැටළු, මායිම් පිළිබඳ ගැටළු, ප්‍රවේශ මාර්ග පිළිබඳ ආරවුල් යනාදි විවිධ හේතූන් නිසා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාව අතරතුර ලිපිගොනු පසෙක තැබීම සිදුවී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එසේ පසෙක තැබූ ගොනු 392,456 ක් වී තිබුණි. දිගින් දිගටම මෙම තත්ත්වය වර්ධනය වී තිබීම හේතු කොට ගෙන නිරවුල් කිරීමේ කාර්යයන් ඉටුකිරීම ද ප්‍රමාදවී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) තිරසර සංවර්ධනය**

**-------------------**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

-----------------------------------

**2.2.1** දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 9.70 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 9.67 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

- 2017 ජුලි 31 දිනට සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මෙහි පරිගණක පුටු 06 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, පුටු 02 ක් පමණක් මිලදීගෙන තිබුණි. Hoover යන්ත්‍ර 02 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, එක් යන්ත්‍රයක් පමණක් මිලදී ගෙන තිබුණි. Hoover යන්ත්‍ර මිලදී ගැනීමේදී මිලෙහි අවාසි විචලනය රු. 53,490 ක් එනම් සියයට 178 ක් විය.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------

රු.මිලියන 36.4 ක ඇස්තමේන්තුවක් මත හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් නිල නිවස ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු අතර අදාල කොන්ත්‍රාත්කරු වෙත එය 2016 මාර්තු 10 දින භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් ආරම්භ කර තිබුණු ඉඩම් කොටසේ නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.

(ii) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ එළැඹ තිබුණු අවබෝධතා ගිවිසුම අනුව ඇස්තමේන්තු මුදලින් සියයට 50 ක අත්තිකාරමක් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ගෙවිය හැකි වුවද, ගිවිසුමට එළැඹීමට දින 40 කට ප්‍රථමයෙන් රු.මිලියන 10 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන සලසා තිබුණි.

(iii) 2016 දෙසැම්බර් 08 දින වන විට මෙම නිල නිවාසයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළ යුතු වුවද 2018 මැයි 01 දින වන විටත් ඇස්තමේන්තුවේ සඳහන් කාර්යයන් 06 ක් සම්පූර්ණ කර නොතිබියදී 2016 නොවැම්බර් 30 දින වනවිට සම්පූර්ණ ඇස්තමේන්තු මුදල වූ රු.මිලියන 36.4 ම ගෙවා තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන අළුත්වැඩියාව

-------------------------

කැබ්රථ දෙකක අළුත්වැඩියාවන් කිරීමේදී රියදුරු විසින් දැනුම් දෙන ලද දෝෂ සහ අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවා එම මිල ගණන් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. කවර ආයතනයකින් අළුත්වැඩියාව සිදු කළ යුතු ද යන්න යාන්ත්‍රික ඉංජිනේරුවරයා ලවා නිර්දේශ ලබාගැනීම සිදුකර තිබුණද යාන්ත්‍රික ඉංජිනේරු විසින් අදාල දෝෂය පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. මෙම වාහන දෙක අළුත්වැඩියා කිරීමෙන් පසුවද පරීක්ෂා කිරීමකින් තොරව යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය ලබාදී තිබුණි.

### (ආ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්

---------------------------------

දෙපාර්තමේන්තුව සතුව ගොඩනැගිලි 4 ක් පවතින අතර, මෙයට අමතරව වාර්ෂිකව රු.16,450,500 ක කුලියක් මත ලබාගත් ගොඩනැගිලි 39 ක ද කාර්යාල කටයුතු පවත්වාගෙන යනු ලබයි. වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු.1,568,640 ක් වන අතර ආරක්ෂක සේවා ගාස්තුව රු.19,617,275 ක් වේ. ඒ අනුව මුළු ගොඩනැගිලි වෙනුවෙන් වූ වියදම රු.37,636,415 ක් වී තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වාගෙන යාමේ වියදම රු.54,466 ක් වී තිබුණි.
දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 04 ක් සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබාගැනීම සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව, ප්‍රාදේශීය කාර්යාලය භාර සහකාර/ නියෝජ්‍ය කොමසාරිස් විසින් සුදුසු බවට නිර්දේශ කරන ලද ගොඩනැගිල්ලක් තෝරාගෙන තිබුණි.

(ii) ගොඩනැගිලි කුලියට ගන්නා අවස්ථාවේදී පුවත්පත් දැන්වීම් පලකර මිල ගණන් කැඳවීම හා ගොඩනැගිලි ආපසු භාර දීමේදී, දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු 2014 ජුලි 21 දිනැති අංක 1/2014 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණි.

(iii) ගහවට කෝරලේ ප්‍රාදේශීය කාර්යාලය, නව කාර්යාල ගොඩනැගිල්ලක් වෙත ගෙනයාමට අදාල ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබීමට මාස දෙකකට පෙර, වර්ෂ දෙකක කාලයක් සඳහා 2016 මැයි 05 දින බදු ගිවිසුම් අත්සන් කර, රාජකාරි කටයුතු

ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, වර්ෂයක කාලයක් සඳහා බදු ගිවිසුම් සඳහා එළැඹීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදී තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---

ඉඩම් අමාත්‍යාංශය සතු රු.මිලියන 27 ක් වටිනා මෝටර් වාහන 07 ක් වර්ෂ 09 සිට වර්ෂ 14 දක්වා කාලයක් දෙපාර්තමේන්තුව විසින් විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණි.

## 2.4 කළමනාකරණ දුර්වලතා

---

මොරටුව කාර්යාල බල ප්‍රදේශයේ මැනුම් කටයුතු 2015 වර්ෂයේ දී වනවිටත් අවසන්ව තිබුණද, එහි හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ ඉදිරි ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අවසන් කර නොතිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 200.59 | 200.26 | 0.33 | 0.16 |
| | මූලධන | 5.70 | 4.24 | 1.46 | 25.61 |
| | **එකතුව** | **206.29** | **204.50** | **1.79** | **0.87** |
| 2014 | පුනරාවර්තන | 295.18 | 293.71 | 1.47 | 0.50 |
| | මූලධන | 12.90 | 12.03 | 0.87 | 6.74 |
| | **එකතුව** | **308.08** | **305.74** | **2.34** | **0.76** |
| 2015 | පුනරාවර්තන | 377.80 | 369.87 | 7.93 | 2.10 |
| | මූලධන | 22.50 | 19.12 | 3.38 | 15.02 |
| | **එකතුව** | **400.30** | **388.99** | **11.31** | **2.82** |
| 2016 | පුනරාවර්තන | 385.61 | 379.50 | 6.11 | 1.58 |
| | මූලධන | 37.40 | 36.74 | 0.66 | 1.76 |
| | **එකතුව** | **423.01** | **416.24** | **6.77** | **1.60** |
| 2017 | පුනරාවර්තන | 386.38 | 379.83 | 6.55 | 1.69 |
| | මූලධන | 15.00 | 6.36 | 8.64 | 57.6 |
| | **එකතුව** | **401.38** | **386.19** | **15.19** | **3.78** |

පහතින් දැක්වෙන හේතුන් නිසා අයවැය ඇස්තමේන්තුව තාත්ත්වික ලෙස පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) ප්‍රාග්ධන වැය විෂයක් සඳහා සලසා තිබුණු රු.8,500,000 ක්ද, පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.738,668 ක ප්‍රතිපාදන ද මුළුමනින්ම ඉතිරි වී පැවතුණි.

(ii) මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද රු.100,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 24.00 | 22.60 | 15.00 | 16.10 | 67.00 | 49.40 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.545,954 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂයක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, ඒවා අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | අලාභහානියක් සිදුවූ වහාම ප්‍රාරම්භක වාර්තා සහ මාස 03 ක් ඇතුළත පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, 2017 නොවැම්බර් 07 දින අනතුරට පත් වූ වාහනයේ ප්‍රාරම්භක සහ පරිපූර්ණ වාර්තාද , 2017 නොවැම්බර් 30 දින අනතුරට පත් වූ වාහනයේ පරිපූර්ණ වාර්තාවද 2018 මාර්තු 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවේ වාහන 06 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2017 ජුනි 28 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | පිරියත හා යන්ත්‍ර උපකරණ පිළිබඳ තොරතුරු 2017 සැප්තැම්බර් 15 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතු වුවද 2018 මාර්තු 31 දින දක්වාත් යැවීමට කටයුතු කර නොතිබුණි. |

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### 2.9.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 356.1 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.440,721 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 43 | 64 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 1746 | 609 | 1137 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 254 | 151 | 103 |
| (v) | අනියම්/ කොන්ත්‍රාත් | 126 | - | 126 |
| | | 2240 | 808 | 1432 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිත්‍ය කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස්වරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 80 ක් පැවතීම හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය කෙරෙහි බලපෑම් ඇතිවන බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය කාර්යාල 90 ක් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන තිබුණද වර්තමානයේ ප්‍රාදේශීය කාර්යාල 43 ක් පමණක් පවත්වාගෙන යාම තුළ අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කරගැනීමට කටයුතු නොකිරීමද, පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීමට හේතු වී තිබුණි.